සිව්වැනි සතිය

සිව්වන සැසිය

# රාජ්‍ය වියදම්, අයවැය හිඟය හා රාජ්‍ය ණය

All Rights Reserved © 2023
Verité Research

# සාකච්ඡාවට බඳුන් කෙරෙන ක්ෂේත්‍ර

1. රාජ්‍ය වියදම් පිළිබඳ කෙටි සමාලෝචනයක්
    1.1 රජයේ වියදම්වල සංයුතිය
    1.2 වසර කිහිපයක ප්‍රවණතා
    1.3 රටවල් කිහිපයක් පාදක සංසන්දනාත්මක විග්‍රහය
    1.4 ආංශික විශ්ලේෂණය
2. රජයේ වියදම් හා සබැඳි ගැටලු
3. විස්තීර්ණ ණය පහසුකම යටතේ රජයේ වියදම්වලට අදාළ බැඳියාවන්
4. අයවැය හිඟය හා ණය

All Rights Reserved © 2023
Verité Research

# 1. රාජ්‍ය ව්‍යවසායවල සංයුතිය

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාව 2022 වසරේදී ඉහළම හිඟය වාර්තා කරයි


රාජ්‍ය වියදම් සංයුතිය (රුපියල් බිලියනවලින්)

**අයවැය ශේෂය =**
**ආදායම් - වියදම්**

**2022 දී අයවැය හිඟය:**
**රු. බිලියන 2,460**

**2023 සඳහා ඇස්තමේන්තුගත අයවැය හිඟය:**
**රු. බිලියන 2,398**

**2023 පළමු කාර්තුව තුළ සත්‍ය අයවැය හිඟය:**
**රු. බිලියන 625**




මූලාශ්‍රය: 2023 අනුමත අයවැය ඇස්තමේන්තු


All Rights Reserved © 2023
Verité Research

# 2022 වසර තුළ රජයේ වියදම්වලින් 35%ක් ම පොලී ගෙවීම්වලින් සමන්විත විය

*(රුපියල් බිලියනවලින්)*

**රජය වියදම් කරන ලද්දේ කවර හේතු සඳහාද?**

**ඒ සඳහා රජය මූල්‍ය සම්පාදනය කරගෙන ඇත්තේ කෙසේද?**




**අයවැය හිඟය සඳහා මූල්‍ය සම්පාදනය**

- දේශීය මූල්‍ය සම්පාදන :**83%**
- විදේශීය මූල්‍ය සම්පාදන : **17%**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව

All Rights Reserved © 2023
Verité Research

# 1.2 වසර කිහිපයක් තුළ ප්‍රවණතා

**1.2.1 සමස්ථ වියදම**


**1.2.2 රජයේ වියදම් පිළිබඳ විදසුන්**

**අ) පොලී ගෙවීම්**

**ආ) සමාජීය වියදම්**

All Rights Reserved © 2023
Verité Research

# 2022 හා 2023 වසරවලදී රජයේ වියදම් වටිනාකම අතින් ඉහළ ගොස් ඇති නමුත් ද.දේ.නි. හි %ක් ලෙස පහත බැස තිබේ





මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව (2022) | 2023 අයවැය ඇස්තමේන්තු

සටහන: ගිණුම්කරණ දෝෂය නිවැරදි කර ඇති හෙයින් 2019 හා 2020 වර්ෂවලට අදාළ සංඛ්‍යාවන් වෙනස් වේ.

All Rights Reserved © 2023
Verité Research

# ආදායමට වඩා ඉහළ අනුපාතයකින් වියදම් ඉහළ යාමෙහි ප්‍රතිඵලයක් ලෙස වසර කිහිපයක් මුළුල්ලේ අයවැය හිඟය ප්‍රසාරණය වී ඇත





මූලාශ්‍ර: 2023 අනුමත අයවැය ඇස්තමේන්තු | ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව

All Rights Reserved © 2023
Verité Research

අ) පොලී ගෙවීම්

# ගත වූ වසර හය තුළ, සාමාන්‍යයක් ලෙස පොලී ගෙවීම් පුනරාවර්තන වියදම්වලින් 40%ක් සඳහා හේතු වී ඇත





මූලාශ්‍ර: 2023 අයවැය ඇස්තමේන්තු | මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2022
සටහන: පොලී ගෙවීම්, පුනරාවර්තී වියදම් සඳහා වෙන් කර ඇති වටිනාකම ලෙස සැලකේ.


All Rights Reserved © 2023
Verité Research

# ඉහළ යන පොලී ගෙවීම් අනෙකුත් වියදම් අභිබවා යයි

## 2021 හා 2022 අතර කාලය තුළ පොලී ගෙවීම් 49%ක සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇත




## වසර ගණනාවක් පුරාවට රජයේ මුළු විදයම් සඳහා බලපා ඇති ප්‍රධානතම සාධකය ලෙස පවතින්නේ පොලී වියදමය






| 2013 සහ 2022 අතර සාමාන්‍ය වර්ධන අනුපාතය | වැටුප් හා වේතන | පොලී ගෙවීම් | සංක්‍රාම ගෙවීම් | ප්‍රාග්ධන වියදම් | වෙනත් |
|---|---|---|---|---|---|
| | **11%** | **15%** | **14%** | **10%** | **3%** |

මූලාශ්‍ර: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා 2012-2022

All Rights Reserved © 2023
Verité Research

# 2022 දී මුළු රාජ්‍ය වියදම ඉහළ ගිය ප්‍රමාණයෙන් 83% ක්, පොලී ගෙවීම් සහ රාජ්‍ය ව්‍යවසායයන්ට ණය ලබා දීම් වේ








මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2022


All Rights Reserved © 2023
Verité Research

# 2023 අයවැය කතාවෙන් රු. බි. 49.5 ක් වටිනා නව වියදම් යෝජනා සඳහා වෙන් කර ඇති මුදල්වලින් 87%ක් ම සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන වෙනුවෙනි

**සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන සඳහා වියදම්**
**(නව වියදම් යෝජනාවල මුළු වටිනාකමෙහි %ක් ලෙස)**




**සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන සඳහා වියදම් බෙදී යාම**





බලපෑමට ලක් වූ සෑම පවුලක් සඳහාම රු. 20,000/- බැගින් වූ මුළු ගෙවීමක්

එක් සමෘද්ධි ප්‍රතිලාභියෙකු සඳහා මසකට අවම රු. 3,000/- ක දීමනාවක්

මූලාශ්‍රය: 2023 අයවැය කතාවට ඇමුණුම්

All Rights Reserved © 2023
Verité Research


# සමෘද්ධි සහනාධාරවල සිදු වූ 118%ක වැඩි වීම, 2022 දී සමාජයීය වියදම් අධික ලෙස ඉහළ යාමට හේතු විය




මූලාශ්‍රය: වාර්ෂික වාර්තාව 2022, ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය

All Rights Reserved © 2023
Verité Research

# 2022 දී සමෘද්ධි සහනාධාරයේ 118%ක ඉහළ යාමට පෙර, ශ්‍රී ලංකාවේ සමාජයීය වියදම් අනෙකුත් කලාපීය රටවල් හා සැසඳීමේදී අඩුම මට්ටමක පැවතුණි




මූලාශ්‍රය: ලෝක බැංකු දත්ත පදනම


මූලාශ්‍රය පාදක සටහන: ප්‍රතිලාභ හා පරිපාලන පිරිවැය මත සිදු කරන වියදම් සමාජ සහායක වියදම් යන්නෙන් අදහස් වේ. මෙහි වාර්ෂික සමාජ සහායක වියදම් ගණනය කර ඇත්තේ 2015-2021 අතර කාල සීමාව තුළ තොරතුරු ලබා ගත හැකි ආසන්නතම වර්ෂයට අදාළ වැඩසටහන් මට්ටමේ සමාජ සහායක වියදම් දත්ත එකතු කිරීමෙනි. මෙම වියදම් සම්මත සමාජ සහායක වියදම් කාණ්ඩ වෙත එක් කර ඇති අතර ඉන් අනතුරුව, සමස්ථ සමාජ සහායක වියදම ගණනය කරනු පිණිස එකතු කරනු ලැබේ. දර්ශකය ගණනය කරනු පිණිස සමාජ සහායක වියදම් ඒ ඒ රටෙහි ද.දේ.නි. (වත්මන් වටිනාකම) මගින් බෙදා ඇත. ද.දේ.නි. පිළිබඳ දත්ත ලෝක බැංකුවේ ලෝක සංවර්ධන දර්ශක වෙතින් ලබා ගන්නා ලදි. අපේක්ෂිත දත්ත මගින් ආසන්න වශයෙන් WBG රටවල් 80%ක් ආවරණය වන අතර එමගින් ඉහළ ආදායම්ලාභී රටවල් නියෝජනය නොකෙරේ.

# 1.3 රටවල් කිහිපයක් පාදක සංසන්දනාත්මක විග්‍රහය

All Rights Reserved © 2023

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම (ද.දේ.නි. යේ % ලෙස) ලොව අඩුම රාජ්‍ය වියදම් සහිත රටවල් කාන්ඩයට අයත් වේ


ද.දේ.නි. හි %ක් ලෙස වියදම් (2015 සිට 2022 දක්වා වසර 10ක සාමාන්‍යය මත පදනම්ව)





මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක ආර්ථික ඉදිරි දැක්ම දත්ත පදනම - අප්‍රේල් 2023
සටහන: මෙම අගයයන් මඟින් රටවල් 09 හි ම ආදායම් සාමාන්‍යය දැක්වේ

All Rights Reserved © 2023
Verité Research

## ද.දේ.නි. හි %ක් ලෙස සලකා බැලූ කල අධ්‍යාපනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම, කලාපයේ බොහෝ රටවලට වඩා අඩු වේ




## ද.දේ.නි. හි %ක් ලෙස සලකා බැලූ කල ශ්‍රී ලංකාවේ ආරක්ෂක වියදම් කලාපයේ බොහෝ රටවලට වඩා වැඩි වේ





මූලාශ්‍රය: ලෝක බැංකු දත්ත පදනම

සටහන: ලෝක බැංකුවට අනුව 'ආරක්ෂක වියදම්' යන්න අර්ථ දැක්වෙන්නේ පහත පරිදි ය:

අවිගත් බලකායයන්, සාම සාධක බලකායයන්, ආරක්ෂක අමාත්‍යාංශ හා ආරක්ෂක ව්‍යාපෘතිවල නිරත වන අනෙකුත් රජයේ ආයතන ආ පාර්ලිමේන්තු බලකායයන් ආදිය ආරක්ෂක (මිලිටරි) මෙහෙයුම් වෙනුවෙන් සන්නද්ධ කොට හා පුහුණු කොට තිබේ නම් ඒ වෙනුවෙන් වැය කෙරෙන සියලුම ප්‍රවර්තන හා ප්‍රාග්ධන වියදම් ආරක්ෂක වියදම් යන්නට ඇතුළත් වේ. එකී වියදම් අතරට මිලිටරි පුද්ගලයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ හා සමාජ සේවාවන්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු, ප්‍රසම්පාදන, මිලිටරි පර්යේෂණ හා සංවර්ධන සහ මිලිටරි සහාය ලබා දීම (ආධාර ලබා දෙන රටෙහි ආරක්ෂක වියදම්වලින්) ඇතුළුව මිලිටරි හා සිවිල් පුද්ගලයන් අන්තර්ගත වේ. කෙසේ වෙතත්, පළපුරුද්ද මත ලබා දෙන ප්‍රතිලාභ, හමුදා සේවයෙන් මිදවීම සහ අවි ආයුධ විනාශ කිරීම ආදී සිවිල් ආරක්ෂක හා පූර්ව ආරක්ෂක කටයුතු වෙනුවෙන් දරනු ලබන වියදම් ඉන් බැහැර කෙරේ.

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය වියදම් කලාපීය සෙසු රටවලට සමාන මට්ටමක පවතී





මූලාශ්‍රය: ලෝක බැංකු දත්ත පදනම; පහළ මධ්‍යම ආදායම්ලාභී කාණ්ඩ සමුච්චිතය. පහළ මධ්‍යම ආදායම්ලාභී ආර්ථිකයන් යනු 2022 ඒක පුද්ගල දළ ජාතික ආදායම ඇ.ඩො. 1,136 සහ ඇ.ඩො. 4,465 අතර පැවැති රටවල්ය. ඉහළ මධ්‍යම ආදායම්ලාභී කාණ්ඩ සමුච්චිතය. ඉහළ මධ්‍යම ආදායම්ලාභී ආර්ථිකයන් යනු 2022 ඒක පුද්ගල දළ ජාතික ආදායම ඇ.ඩො. 4,466 සහ ඇ.ඩො. 13,845 අතර පැවැති රටවල්ය.

All Rights Reserved © 2023
Verité Research

# 1.4 ආංශික විශ්ලේෂණය

All Rights Reserved © 2023
Verité Research

# 2018 සිට ආරක්ෂක වියදම් ද.දේ.නි. හි %ක් ලෙස පහත බසින ප්‍රවණතාවක් පිළිබිඹු කළද වටිනාකම අතින් එහි අගය ඉහළ ගොස් තිබේ






2013-2023 අයවැය ඇස්තමේන්තු


සටහන: ආරක්ෂක අංශය යන්නට ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළත් වේ.


All Rights Reserved © 2023
Verité Research

# 2023 වසරේදී අධ්‍යාපනය, සෞඛ්‍යය, කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය යන අංශ සඳහා මුදල් වෙන් කර ඇත්තේ ආරක්ෂක අංශයට වඩා අඩුවෙනි








2013-2023 අයවැය ඇස්තමේන්තු
සටහන: අධ්‍යාපන අංශයට අධ්‍යාපන අමාත්‍යාංශයද, සෞඛ්‍ය අංශයට සෞඛ්‍ය අමාත්‍යාංශයද, ධීවර අංශයට ධීවර අමාත්‍යාංශයද, අධ්‍යාපන අංශයට අධ්‍යාපන අමාත්‍යාංශයද ඇතුළත් වේ.
සටහන: අවැය ඇස්තමේන්තු අදාළවල වසරවල අමාත්‍යාංශවල නම් වෙනස් වී ඇත.

All Rights Reserved © 2023
Verité Research

# 2023 වසරේ ආරක්ෂක අංශය යටතේ ආහාර පාන හා නිල ඇඳුම් සඳහා ඇස්තමේන්තුගත වියදම් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික අයවැයෙන් ¼ කට සමාන වේ





මූලාශ්‍රය: 2023 අයවැය ඇස්තමේන්තු | ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව
සටහන: ආරක්ෂක අංශයට ආරක්ෂක අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළත් වේ.

All Rights Reserved © 2023
Verité Research

# රජයේ වැටුප්වලින් ආසන්න වශයෙන් අඩක් පමණ ආරක්ෂක අංශය සඳහා වෙන් කෙරේ

## අංශය අනුව වැටුප් සඳහා මධ්‍යම රජයේ වියදම් වෙන් කිරීම් (2023 අයවැය ඇස්තමේන්තු)




මූලාශ්‍රය: 2023 අයවැය ඇස්තමේන්තු

1 සටහන: රාජ්‍ය ව්‍යවසායයන්හි සේවය කරන සේවකයන්ගේ වැටුප් හා වේතන මෙහි ඇතුළත් නොවේ.

2 සටහන: 'පුද්ගල පාරිශ්‍රමික' යන්නට වැටුප් හා වේතන, අතිකාල දීමනා හා නිවාඩු දින ගෙවීම් සහ වෙනත් දීමනා ඇතුළත් වේ.

3 සටහන: "ආරක්ෂක අංශය" යන්නට ආරක්ෂක අමාත්‍යාංශය (ත්‍රිවිධ හමුදා සඳහා වෙන් කෙරෙන පුද්ගල පාරිශ්‍රමික හැර) සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළත් වේ.

4 සටහන: ප්‍රවාහන හා සන්නිවේදන අංශය අමාත්‍යාංශ දෙකකින්ද, සුභසාධන හා ප්‍රජා සේවා අංශය අමාත්‍යාංශ තුනකින්ද, ප්‍රාදේශීය හා පළාත් පාලන අංශය එක් අමාත්‍යාංශයකින්ද, නීති අංශය එක් අමාත්‍යාංශයකින්ද, සෞඛ්‍ය අංශය එක් අමාත්‍යාංශයකින්ද, අධ්‍යාපන අංශය එක් අමාත්‍යාංශයකින්ද, කෘෂිකර්ම අංශය අමාත්‍යාංශ දෙකකින්ද, ආරක්ෂක අංශය අමාත්‍යාංශ දෙකකින්ද, වෙනත් යන අංශය අමාත්‍යාංශ 17කින් ද සමන්විත වේ.

5 සටහන: "වෙනත්" යන කාණ්ඩයට මුදල්, විදුලිබල හා බලශක්ති, සංචාරක, කර්මාන්ත, ජල හා සනීපාරක්ෂක, නාගරික සංවර්ධන, විදේශ කටයුතු යන අංශ යටතට ගැනෙන අමාත්‍යාංශ හා විශේෂ වැයකිරීම් ඒකක අයත් වේ.

# 2. රජයේ වියදම් හා සබැඳි ගැටලු


**2.1.** ප්‍රමාණවත් නොවන ආදායම / අඩු මූල්‍ය ශක්‍යතාව

**2.2.** ප්‍රමාණවත් ලෙස මුදල් වෙන් නොකිරීම

**2.3.** දුර්වල සැලසුම්කරණය

All Rights Reserved © 2023
Verité Research


# 2022 වසරේ රාජ්‍ය ආදායම ප්‍රමාණවත් වූයේ වියදම් අවශ්‍යතාවලින් 45%ක් සපුරා ගැනීමට පමණි




මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව 2022 | * රාජ්‍ය ආයෝජන පමණක් ඇතුළත් වේ

All Rights Reserved © 2023
Verité Research


# පුනරාවර්තන වියදම් ආවරණය කිරීමටවත් ශ්‍රී ලංකාවේ ආදායම ප්‍රමාණවත් නොමැත




මූලාශ්‍ර: මහ බැංකු වාර්ෂික වාර්තා | මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව 2022 | 'පුනරාවර්තී වියදම් යන්නට' වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප්, සේවා හා අනෙකුත් සහනාධාර, පොලී ගෙවීම් ආදිය ඇතුළත් වේ.

All Rights Reserved © 2023
Verité Research


# 2010 සිට 2012 දක්වා රාජ්‍ය ආදායමෙන් 50%කට අධික කොටසක් වැටුප් හා වේතන සඳහා වැය කොට තිබේ




මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා | 2015 සිට ද.දේ.නි. නව වර්ෂ පාදකව ප්‍රතිපාදක කර තිබේ

All Rights Reserved © 2023
Verité Research

# ගත වූ වසර පහ තුළ (2021 හැර), අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවලට වඩා වැඩියෙන් ආරක්ෂාව හා අධිවේගී මාර්ග වෙනුවෙන් අයවැයගත මුදල් වෙන් කිරීමක් සිදු කොට ඇත





මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තුවල විවිධ සංස්කරණ/අනුවාද (2021-2023) | මුදල් අමාත්‍යාංශය 2022 | ශ්‍රී ලංකා මහ බැංකුව 2022

All Rights Reserved © 2023
Verité Research

# අධ්‍යාපන, සෞඛ්‍ය හා කෘෂිකර්ම අංශ සඳහා සිදු කොට ඇති අයවැයගත මුදල් වෙන් කිරීම රාජ්‍ය වියදමින් 11.4%ක් පමණි

**2023 වසර සඳහා අංශ අනුව ඇස්තමේන්තුගත මුදල් වෙන් කිරීම**





මූලාශ්‍රය: 2023 අයවැය ඇස්තමේන්තු

සටහන: ප්‍රවාහන හා සන්නිවේදන අංශය අමාත්‍යාංශ දෙකකින්ද, සුභසාධන හා ප්‍රජා සේවා අංශය අමාත්‍යාංශ තුනකින්ද, ප්‍රාදේශීය හා පළාත් පාලන අංශය අමාත්‍යාංශ එකකින්ද, නීති හා අධිකරණ අංශය අමාත්‍යාංශ එකකින්ද, සෞඛ්‍ය අංශය අමාත්‍යාංශ එකකින්ද, අධ්‍යාපන අංශය අමාත්‍යාංශ එකකින්ද, කෘෂිකර්ම අංශය අමාත්‍යාංශ එකකින්ද, ආරක්ෂක අංශය අමාත්‍යාංශ එකකින්ද, මධ්‍යම රජයේ වෙනත් අංශය අමාත්‍යාංශ හතරකින්ද, විදුලිබල හා බලශක්ති අංශය අමාත්‍යාංශ දෙකකින්ද, සංචාරක අංශය අමාත්‍යාංශ එකකින්ද, කර්මාන්ත අංශය අමාත්‍යාංශ හතරකින්ද, ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය අමාත්‍යාංශ දෙකකින්ද, නාගරික සංවර්ධන අංශය අමාත්‍යාංශ පහකින්ද සමන්විත වේ.

All Rights Reserved © 2023
Verité Research

# නව පරිපූරක ඇස්තමේන්තු සමඟින් අයවැය හිඟය 43%කින් ඉහළ යනු ඇත (2022)

රුපියල් බිලියනවලින්





මූලාශ්‍ර: පාර්ලිමේන්තු පුවත් - https://www.parliament.lk/news-en/view/2595 | 2022 අයවැය ඇස්තමේන්තු | සංශෝධිත ආදායම් ඇස්තමේන්තු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ කතාව මත පදනම් වේ.

All Rights Reserved © 2023
Verité Research

# රු. බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුව: එකී මුදල කෙසේ යොදා ගැනේද?

*රුපියල් බිලියනවලින්*




මූලාශ්‍රය: පාර්ලිමේන්තු පුවත් - https://www.parliament.lk/news-en/view/2595

All Rights Reserved © 2023
Verité Research

# 2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහන
# සහ
# වියදම් හා සබැඳි යෝජනා

All Rights Reserved © 2023
Verité Research

# ජාත්‍යන්තර මූල්‍ය වැඩසටහනේ ඇතුලත් වියදම් ආශ්‍රිත එකගතා


| වැඩසටහන් කොන්දේසිය | ඉටු කළ යුතු දිනය | තත්ත්වය |
|---|---|---|
| 2023 මාර්තු මාසය වන විට, හිඟ මුදල්වල වියදම රු. බිලියන 30ක උපරිමයක් ලෙස පවත්වා ගැනීම | මාර්තු 23 | ඉටු කර ඇත |
| 2023 මාර්තු මාසය වන විට, මූල්‍ය නොවන රාජ්‍ය අංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවිය යුතු බාහිර ගෙවීම් හිඟයන්හි වටිනාකම රු. බිලයන 0 ලෙස පවත්වා ගැනීම | මාර්තු 23 | නොදනී |
| සමාජ වියදම් 2023 මාර්තු වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.1 ක් (රුපියල් බිලියන 35) වීම | මාර්තු 23 | ඉටු කර ඇත |
| 2023 මාර්තු මාසය වන විට ප්‍රාථමික හිඟය අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.2% (රු. බිලියන 56) ලෙස පවත්වා ගැනීම | මාර්තු 23 | ඉටු කර ඇත |
| 2023 ජූනි මාසය වන විට ප්‍රාථමික මූල්‍ය හිඟය අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.4%ක් (රු. බි. -113) ලෙස පවත්වා ගැනීම | ජූනි 23 | නොදනී |
| 2023 ජූනි මාසය වන විට හිඟ මුදල් වියදම රු. 0ක උපරිමයක් ලෙස පවත්වා ගැනීම | ජූනි 23 | නොදනී |
| 2023 ජූනි මාසය වන විට මූල්‍ය නොවන රාජ්‍ය අංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවිය යුතු බාහිර ගෙවීම් හිඟයන්හි වටිනාකම රු. බිලයන 0 ලෙස පවත්වා ගැනීම | ජූනි 23 | නොදනී |
| 2023 ජූනි මාසය වන විට සමාජ ආරක්ෂණ වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.2% ක් (රු. බි. 70 ක්) ලෙස පවත්වා ගැනීම | ජූනි 23 | නොදනී |
| 2023 සැප්තැම්බර් මාසය වන විට හිඟ වියදම් රු. බිලියන 0ක උපරිමයක් ලෙස පවත්වා ගැනීම | සැප්-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 සැප්තැම්බර් මාසය වන විට මූල්‍ය නොවන රාජ්‍ය අංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවිය යුතු බාහිර ගෙවීම් හිඟයන්හි වටිනාකම රු. බිලයන 0 ලෙස පවත්වා ගැනීම | සැප්-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 සැප්තැම්බර් මාසය වන විට සමාජ ආරක්ෂණ වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.4%ක් (රු. බි. 120ක්) ලෙස පවත්වා ගැනීම | සැප්-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 සැප්තැම්බර් මාසය වන විට ප්‍රාථමික මූල්‍ය හිඟය අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් හි 0.5%ක් (රු. බි. 160ක්) ලෙස පවත්වා ගැනීම. | සැප්-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 දෙසැම්බර් මාසය වන විට මූල්‍ය නොවන රාජ්‍ය අංශය හා ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ නව බාහිර ගෙවීම් හිඟයන් රු. 0 ක් ලෙස පවත්වා ගැනීම | දෙසැ-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 දෙසැම්බර් මාසය වන විට හිඟ වියදම් රු. 0ක උපරිමයක් ලෙස පවත්වා ගැනීම | දෙසැ-23 | ඉටු කළ යුතුව ඇත |
| 22023 දෙසැම්බර් මාසය වන විට සමාජ ආරක්ෂණ වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් හි 0.6%ක් (රු. බි. 187) ලෙස පවත්වා ගැනීම | දෙසැ-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 දෙසැම්බර් මාසය වන විට ප්‍රාථමික මූල්‍ය හිඟය අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් හි 0.7%ක් (රු. බි. 209) ලෙස පවත්වා ගැනීම | දෙසැ-23 | ඉටු කළ යුතුව ඇත |

මූලාශ්‍ර: ජා.මූ. අ. සහ ශ්‍රී ලංකාව “Request For An Extended Arrangement Under The Extended Fund Facility—press Release; Staff Report; And Statement By The Executive Director For Sri Lanka”

# 4. අයවැය හිඟය හා ණය

All Rights Reserved © 2023
Verité Research


# ගත වූ වසර තුන තුළ අයවැය හිඟය ඉහළ ගොස් තිබේ




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව (2022)

All Rights Reserved © 2023
Verité Research


# ශ්‍රී ලංකාවේ අයවැය හිඟය මැතිවරණ පැවැත්වෙන වර්ෂවලදී ඉහළ යාමේ නැඹුරුවක් පෙන්නුම් කරයි




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2019


All Rights Reserved © 2023
Verité Research

# අයවැය හිඟයට හේතු කවරේද ?
# අප ඒ ගැන සැලකිලිමත් විය යුත්තේ ඇයි?




All Rights Reserved © 2023
Verité Research

# ද.දේ.නි. ට සාපේක්ෂ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය අඛණ්ඩව ඉහළ ගොස් ඇත





මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ 2022 වාර්ෂික වාර්තාව

All Rights Reserved © 2023
Verité Research

# රජයේ මුළු ණය: රජයේ මුළු ණයවලින් 37%ක් ම බැඳුම්කර වේ

## (2022 වර්ෂාවසානය වන විට)





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා 2015-2021 | මුදල් අමාත්‍යාංශය - රාජ්‍ය ණය සාරාංශ


සටහන: ඇ.එ.ජ. ඩොලර් 1 = ශ්‍රී ලංකා රුපියල් 363.1

All Rights Reserved © 2023
Verité Research

# 2022 මැයි මාසයේදී ශ්‍රී ලංකාව ණය ගෙවීම පැහැර හැරීමෙන් අනතුරුව වටිනාකම අතින් සහ ද.දේ. නි. හි ප්‍රතිශතයක් ලෙස දේශීය ණය සැලකිය යුතු තරමින් ඉහළ ගොස් ඇත

## 2022 දී දේශීය ණය 35% කින් ඉහළ ගොස් ඇත





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

All Rights Reserved © 2023
Verité Research

# විදේශ ණය: බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය ණය (2022)


## බහුපාර්ශ්වීය ණය බෙදී යාම

බහුපාර්ශ්වීය ණය බෙදී යාම




## ද්විපාර්ශ්වීය ණය බෙදී යාම

ද්විපාර්ශ්වීය ණය බෙදී යාම





**බහුපාර්ශ්වීය ණය:**
බහුපාර්ශ්වීය ණයක් යනු කිසියම් රජයක් විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හෝ ණය ලබා දෙන රටවල් කිහිපයක එකමුතුවකින් ලබා ගන්නා ණයකි.

**ද්විපාර්ශ්වීය ණය:**
ද්විපාර්ශ්වීය ණයක් යනු රටවල් දෙකක රජයකින් තවත් රජයක් වෙත ලබා දෙන ණයකි.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

All Rights Reserved © 2023
Verité Research

# අනෙකුත් කලාපීය රටවල් හා සැසඳීමේදී ශ්‍රී ලංකාව සතුව ඉහළ ණය මට්ටමක් පවතී




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ප්‍රතිව්‍යුහගතකරණ උපායමාර්ගය

| | 2022 තත්ත්වය | | DSA ඉලක්කය |
|---|---|---|---|
| රාජ්‍ය ණය, ද.දේ.නි. හි %ක් ලෙස | 128 % (ද.දේ. නි. %ක් ලෙස) | 2032 | 95 % ට වඩා පහළ (ද.දේ. නි. %ක් ලෙස) |
| දළ මූල්‍යකරණ අවශ්‍යතා (GFN) (Gross Financing Needs) | 34.6 % (ද.දේ. නි. %ක් ලෙස) | 2027 -32 | 13 % ට පහළ (ද.දේ. නි. %ක් ලෙස) (වාර්ෂික සාමාන්‍යය) |
| විදේශ ණය ආපසු ගෙවීම (Foreign Debt Servicing) | 9.4 % (ද.දේ. නි. %ක් ලෙස) | 2027 -32 | 4.5 % (ද.දේ. නි. %ක් ලෙස) (වාර්ෂික සීමාව) |
| බාහිර මූල්‍යකරණ හිදැස (External Financing Gap) | 2022-27 අතර කාල සීමාව තුළ ණය ආපසු ගෙවීම අඩු වීම මගින් ඇ.ඩො. බිලියන 16.9ක් වටිනා බාහිර මූල්‍යකරණ හිදැස් වසා දැමීමක් සිදු විය යුතුය. | | |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

All Rights Reserved © 2023
Verité Research

ස්තූතියි!